කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍රපීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය, 2017/2018

**INR 3255: මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු දේශපාලනය**

කාලය: **පැය දෙකයි (02)**

ඕනෑම ප්‍රශ්න **තුනකට (03)** පිළිතුරු සපයන්න.

---

1. කොටස් **දෙකටම (02)** පිළිතුරු සපයන්න

   i. භූදේශපාලනයෙහි අංශ **දෙක (02)** කෙටියෙන් පැහැදිලි කරන්න.

   ii. මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ (MENA) භූදේශපාලනික වැදගත්කම කුමක්ද?

2. "ඔටෝමන් අධිරාජ්‍යයේ බිඳවැටීමෙන් මැදපෙරදිග කලාපය තුළ ඇති වූ බල රික්තකය නිරන්තර බල අරගලයකට තුඩු දෙන ලදී". මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයට පවත්නා බාහිර කලාපීය බලපෑම් ඇසුරින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

3. "මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපය තුළ පවතින තෙල් සම්පත් ආශිර්වාදයක් මෙන්ම ශාපයක්ද වේ".සාකච්ඡා කරන්න.

4. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකරමින් මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය පිළිබඳව රචනයක් ලියන්න.

   i. බලපාන ලද සාධක

   ii. පැතිරීම සහ ප්‍රතිඵල

5. මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපය තුළ කාන්තා අයිතිවාසිකම් පිළිබඳව විවේචනාත්මක විග්‍රහයක් කරන්න.

6. පහත සඳහන් **ඕනෑම දෙකක් (02)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

   i. සයික්ස් - පිකොට් ගිවිසුම (Sykes – Picot Agreement)

   ii. මැදපෙරදිග කලාපයේ ජාතිය ගොඩනැගීම

   iii. ආගමික අන්තවාදය

   iv. සිරියානු ගැටුම

****************